මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

2020.02.25

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

ගරු අශූ මාරසිංහ මහතා, පා.ම.
සභාපති
අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිලිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු තුසිතා විජේමාන්න මහත්මිය, පා.ම.
සභාපතිනිය
කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ භාවය පිලිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු සභාපතිතුමියනි/තුමනි,

<u>**'හතේ අපේ පොත'**</u>

මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරෙන්නේ ඉහත අත්පොත පිලිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයි. මෙම නිරීක්ෂණ ඉදිරිපත් කෙරෙන්නේ 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා මව් පනතේ 10 වන වගන්තියේ (ඇ) සහ (ඈ) උපවගන්ති යටතේ මූලික අයිතිවාසිකම් වැඩි දියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමෙහිලා සහ ජාත්‍යන්තර මානව හිමිකම් හා අනුකූලතාවය සහතික කිරීම සඳහා රජයට උපදෙස් ලබාදීමේ කාර්යභාරය යටතේ වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ සෞඛ්‍ය සන්නිවේදන සහ ජීවන නිපුණතා ඒකකය විසින් රචිත මෙම අත්පොතෙන් නව යොවුන් වියට පා තබන පාසැල් දූවරුන් සහ පුතුන්ට නව යොවුන් වියේදී සිදුවන කායික සහ මානසික වෙනස්වීම්, ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා, ඔවුන්ගේ නිර්මාණශීලීත්වයේ වැඩි දියුණුවීම්, පාරිසරික සංවේදීතාවය දියුණු කිරීම ආදී කරුණු රාශියක් පිලිබඳ විද්‍යාත්මක පැහැදිලි කිරීමක් ලබා දෙන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

දැනට මෙම අත්පොත පාසැල් දරුවන්ට ඉගැන්වීම පිලිබඳව අවිනිශ්චිත තත්වයක් ඇති බවත් ඒ පිලිබඳ සාකච්ඡා කිරීමට ඉහත පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටු මඟින් අදාළ විශේෂඥයන් හා සිවිල් සමාජ ක්‍රියාධරයන් සමඟ සාකච්ඡා පැවැත්වූ බවත් අප දැන ගතිමු.

මෙම කොමිෂන් සභාව විසින ඉහත සඳහන් අත්පොත සාකච්ඡාවට ලක් කල අතර, එම අත්පොත පාසල් පද්ධතිය තුල ඉගැන්වීම දරුවන්ගේ මානසික වර්ධනයට හා පෞරුෂ වර්ධනයට ඉතාමත්ම වැදගත්වන බව නිගමනය කරන

ලදී. මෙම අත්පොතේ අන්තර්ගතය මෙම කොමිෂන් සභාව විසින් දකිනුයේ ළමා සංවර්ධනයට අවශ්‍ය තොරතුරු විද්‍යාත්මක පදනමකින් හා විධිමත් අධ්‍යාපනය තුලින් දරුවන් වෙත ලබා දීමේ ප්‍රශස්ත වෑයමක් ලෙසයි.

නිර්මාණශීලී, ඉහල ආත්ම විශ්වාසයකින් හෙබි, මානසික හා කායික සුවතාවයෙන් ඉහල මට්ටමක සිටින දරුවන් බිහි කිරීම ඕනෑම සමාජයක මූඛ්‍ය අරමුණ වේ. ශ්‍රී ලංකාව පිළිගෙන ඇති ළමා අයිතිවාසිකම්වල මූඛ්‍ය අරමුණ වන්නේද එයම වේ. 1991 වර්ෂයේදී ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් පිලිබඳ සම්මුතිය ශ්‍රී ලංකාව විසින් ස්ථිර කොට එම සම්මුතිය යටතේ නෛතික යුතුකම් භාරගැනීමට එකඟ විය. ඒ හා සමගාමීව 1992 වසරේදී ශ්‍රී ලංකා රජය විසින් ළමා ප්‍රඥප්තිය සකස් කරන ලදී. එම ප්‍රඥප්තියේ 17 වන වගන්තිය යටතේ දරුවන්ගේ කායික සහ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට දරුවන් සඳහා සුදුසු තොරතුරු සඳහා ප්‍රවේශය සහතික කර ඇති අතර, එහි 25 වගන්තිය යටතේ දරුවාගේ සෞඛ්‍ය සහ සෞඛ්‍ය සේවා භුක්ති විඳීමේ අයිතිය තහවුරු කොට ඇත. මෙසේ තහවුරු කර ඇත්තේ ළමා අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ප්‍රතිපාදනයන් වේ.

බොහෝ විට සාම්ප්‍රදායික පරිසරයක් තුල දෙමව්පියන් සහ වැඩිහිටියන් (ගුරුවරුන්ද ඇතුළුව) නව යොවුන් විය පිලිබඳ අවශ්‍ය උපදෙස්, තොරතුරු හා උපදේශනයන් දූ දරුවන්ට ලබා දීමෙන් වැළකී සිටී. එහෙත් සංකීර්ණ තොරතුරු  යුගයක ජීවත් වන අප දරුවන් හට නව යොවුන් වියේදී සිදුවන කායික සහ මානසික වෙනස්වීම, සහ ඔවුන්ගේ ලිංගිකත්වය පිලිබඳ නොයෙක් තොරතුරු නොයෙක් මූලාශ්‍රවලින් ලැබෙන බව ප්‍රත්‍යක්ෂ කරුණකි. බොහෝ අවස්ථාවලදී එම තොරතුරු විකෘති හා ත්‍රාසජනක ආකාරයට ඉදිරිපත් කිරීම නිසාවෙන් දරුවන් නොමඟ යැවීමට හේතු වන බවද අප හොඳින් දන්නා කරුණකි. එම නිසා අපගේ දූදරුවන්ට වැදගත් ලෙස විද්‍යාත්මක පදනමකින් යුතු මෙම තොරතුරු දරුවන් ගරු කරන ගුරුවරුන් විසින් ඉගැන්වීම අපගේ අනාගත පරපුරේ අයිතීන් වෙනුවෙන් සිදුකරන මහඟු ප්‍රයත්නයක් බව අප කොමිෂන් සභාවේ මතය වේ. මෙම අත්පොත නිර්මාණය කර ඇත්තේ සෞඛ්‍ය සන්නිවේදන සහ ජීවන නිපුණතා පිලිබඳ මනා දැනුමක් ඇති වෛද්‍යවරුන් පිරිසක් මඟින් බව අප අමතක නොකළ යුතුය.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ඉහත නිරීක්ෂණ ඔබගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුවල  කාරුණික සැලකිල්ලට ගන්නා මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

එමෙන්ම උක්ත කරුණ පිලිබඳ ඉදිරියේදී සාකච්ඡා වට පවත්වෙන්නේනම් අප මානව හිමිකම් කොමිෂන් සභාවටද කරුණු දැක්වීමට අවස්ථාව සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

සභාපතිනිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka